සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 09 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව

නම/විභාග අංකය :- ........................................................................ කාලය: පැය 02 යි.

### I කොටස

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට වඩාත් නිවැරදි පිළිතුර යොදා සම්පූර්ණ කරන්න.

(01) ලෝකයේ වැඩිම වර්ෂාපතනයක් ලැබෙන්නේ ඉන්දියාවේ ........................................ ප්‍රදේශයටයි.

(02) ශ්‍රී ලංකාවේ සමස්ත ජලවහන රටාව ........................................ රටාවක් පෙන්නුම් කරයි.

(03) ශ්‍රී ලංකාවට විදුලිය සපයන ප්‍රධාන මාර්ග දෙක වන්නේ තාප විදුලිය හා ........................................ විදුලියයි.

(04) වර්තමාන අවශ්‍යතා සපුරා ගනිමින් අනාගත පරපුරට ද තම අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට ඇති අයිතිය තහවුරු කරන පරිසරයක් ගොඩනගමින් සිදුවන සංවර්ධනය ........................................ සංවර්ධනය නම් වේ.

(05) ශ්‍රී ලංකාවට නොවැම්බර් - දෙසැම්බර් මාස වල දී වැඩිපුර වැසි ලැබෙන්නේ ........................................ වර්ෂාව මගිනි.

- අංක 06 - 10 දක්වා දී ඇති වාක්‍ය කියවා බලා නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

(06) ආසියානු කලාපයේ ජීවත්වන මානව වර්ග දෙකෙන් ශ්‍රී ලංකාව අයත්වන මානව වර්ගය වන්නේ කොකසොයිඩ් ය. ( )

(07) ලෝකයේ විශාලත ම මෝටර් රථ නිෂ්පාදකයන් දපදෙනා අතුරින් ජපානයට පළමු ස්ථානය හිමි වේ. ( )

(08) මොණරාගල, වව්නියාව, මන්නාරම හා මුලතිව් යන දිස්ත්‍රික්ක අඩු ජන සංඛ්‍යා ව්‍යාප්තියක් පෙන්නුම් කරන දිස්ත්‍රික්ක වේ. ( )

(09) අක්‍රමවත් නාගරීකරණය නිසා පාංශු හා ජලජීවීන් විනාශ වීමත්, ජලය අපවිත්‍රවීමත් සිදුවේ. ( )

(10) 1 : 50000 මෙට්‍රික් සිතියම්වල පළාත් මායිම, දිස්ත්‍රික්ක මායිම ඇතුළු බොහෝ මායිම් ඇඳ දක්වන්නේ රතු පැහැයෙනි. ( )

- අංක 11 - 15 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

(11) ලෝකයේ ගැඹුරුතම මිරිදිය විල ලෙස සැලකෙන්නේ,

(1) මලමුහුද (2) බොල්කාෂ් විල (3) බයිකල් විල (4) අරල් විල

(12) ආසියාවේ ඉහළ උෂ්ණත්වයක් වාර්තාවන ජාකොබාබාද් ප්‍රදේශය පිහිටා ඇති රට මින් කුමක් ද?

(1) ඉන්දියාව (2) පාකිස්තානය (3) මැලේසියාව (4) වියට්නාමය

(13) ගංමෝය ප්‍රදේශයේ දී ගංගාව අතු ගංගාවලට බෙදෙමින් නිර්මාණය වන ත්‍රිකෝණාකාර හැඩයෙන් යුතු බිම් කොටස ඩෙල්ටාව නම් වන අතර පහත සඳහන් ගංගා අතරින් ඩෙල්ටා ලක්ෂණය දැකිය නොහැකි ගංගාව කුමක් ද?

(1) කැළණි ගඟ (2) මහවැලි ගඟ (3) මී ඔය (4) කලා ඔය

(14) රටක සෞඛ්‍ය පහසුකම්වල තත්වය, වෛද්‍ය සේවාවන්ගේ තත්වය, ආහාර හා පෝෂණ මට්ටම, යහපත් සෞඛ්‍ය පුරුදු, ක්‍රීඩා හා විවේකය ගැනීමේ පහසුකම් මත අවබෝධයක් ලබාගත හැකි සංවර්ධන දර්ශක දෙක මින් කුමක් ද?

(1) ඒකශීර්ෂ ආදායම හා ළදරු මරණ අනුපාතිකය

(2) ළදරු මරණ අනුපාතිකය හා සාක්ෂරතාව

(3) උපතේ දී ආයු අපේක්ෂාව හා ඒක ශීර්ෂ ආදායම

(4) ළදරු මරණ අනුපාතිකය හා උපතේ දී ආයු අපේක්ෂාව

(15) කඳුකර ප්‍රදේශවලත්, මධ්‍යම උසකින් යුත් කඳු බෑවුම් ප්‍රදේශවලත් වෙරළබඩ සහ අවට ප්‍රදේශවලත් වගා කෙරෙන ප්‍රධාන බෝග පිළිවෙළින් දක්වෙන පිළිතුර වන්නේ,

(1) රබර්, තේ, පොල් (2) තේ, රබර්, පොල්

(3) රබර්, පොල්, තේ (4) තේ, පොල්, රබර්

- දී ඇති සිතියම ඇසුරින් 16 - 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.




(16) A අක්ෂරයෙන් දක්වා ඇත්තේ,
(නකල්ස් කඳු ය / දොළොස්මහේ කඳු ය.)

(17) B අක්ෂරයෙන් දක්වෙන සානුව
(හැටන් සානුවයි / මහනුවර සානුවයි)

(18) පිදුරුතලාගල කඳු දක්වෙන අක්ෂරය
( F ය/ C ය.)

(19) D වලින් දක්වෙන්නේ,
(නමුණුකුල කන්දයි / පමතල කන්දයි.)

(20) ගෝර්ටන් තැන්න දක්වෙන අක්ෂරය ( E ය / G ය.) (ලකුණු 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු පැටයිය ප්‍රතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (අ) පහත දී ඇති සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.




(i) B අක්ෂරයෙන් දැක්වෙන ශෛල කන්ද (කතරගම කන්දයි / දිඹුලාගල කන්දයි)

(ii) දෙව්නුවර තුඩුව දක්වෙන අක්ෂරය (C / D)

(iii) A අක්ෂරයෙන් දැක්වෙන බොක්ක (කොට්ටියාර් බොක්කයි / ආරුගම් බොක්කයි)

(iv) පුත්තලම කලපුව දක්වෙන අක්ෂරය (C / D)

(v) E අක්ෂරයෙන් දැක්වෙන ගංගාව (කළු ගඟ ය / වළවේ ගඟ ය)

(vi) වෙල්ලේට් දූපත දක්වෙන අක්ෂරය (F / G) (ලකුණු 12)

(ආ) 1 : 50000 භූලක්ෂණ සිතියම්වල දකිය හැකි පහත දක්වෙන සංස්කෘතික ලක්ෂණ අදාල වර්ණ භාවිතයෙන් ඇඳ පෙන්වන්න.

(A) මහා මාර්ගය (B) වත් වගාව

(C) තැපැල් කාර්යාලය (D) දුම්රිය මාර්ගය (ලකුණු 08)

(02) (i) ආසියා මහාද්වීපයට අයත් ප්‍රමාණයෙන් කුඩා දූපත් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු A, B, C අනු පිළිවෙළින් ලියන්න.

A - ලෝකයේ වර්ෂාව අඩුවෙන්ම ලැබෙන ප්‍රදේශය

B - ලෝකයේ පියප්ප නමින් හැඳින්වෙන සානුව

C - කැස්පියන් මුහුදට ගලා බසින ගංගාව (ලකුණු 03)

(iii) භෞතික හා මානුෂ වශයෙන් ආසියානු ප්‍රදේශයේ ඇති සුවිශේෂී ලක්ෂණ දෙකක් නම් කොට ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) එරල් මුහුදට ගලා බසින ගංගා දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ආසියාවේ පිහිටා ඇති ප්‍රධාන සානු තුනක නම් ලියන්න. (ලකුණු 03)

(iii) (a) හිමාලය කඳු පන්තිය තුළ පිහිටි ඉතා උස් කඳු ශිඛර දෙකක් නම් කරන්න.

(b) ආසියාවේ ප්‍රධාන ගංගා තුනක් නම් කරන්න. (ලකුණු 05)

(04) (i) පාකිස්ථානයේ ප්‍රධාන වගා භෝග දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) කාර්මික රටක් වන ජපානය විසින් පවත්වාගෙන යන ප්‍රධාන නිෂ්පාදන කර්මාන්ත තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ආසියාවේ සේවා මධ්‍යස්ථානයක් ලෙස ඩුබායි වැදගත්වීමට හේතු දෙකක් නම් කොට ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) ශ්‍රී ලංකාවේ වෙරළබඩ තැනිතලාවේ දක්නට ලැබෙන වෙරළ දඹ සහිත ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රම තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාව සමකාසන්න රටක් වුව ද උෂ්ණත්වය අඩුවීමට බලපා ඇති හේතු දෙකක් නම් කොට ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) ලංකාවේ පහතරට තෙත් කලාපීය වනාන්තර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) කඳුකර වියළි කලාපීය වනාන්තරවල දකිය හැකි ප්‍රධාන ශාක වර්ග තුනක නම් ලියන්න. (ලකුණු 03)

(iii) කඩොලාන ශාකවල දකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් නම් කොට ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (i) ජීවී හා අජීවී සංරචකයන්ගෙන් නිර්මාණය වී ඇති වටපිටාව පරිසරයයි. පරිසර පද්ධතියේ අජීවී කොටසට අයත් වන සංරචක තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) බලශක්තිය සඳහා පොසිල ඉන්ධන භාවිත කිරීමෙන් ඇතිවන බලපෑම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) පරිසර තුලිතතාව බිඳවැටීමට බලපෑ හේතු දෙකක් නම් කොට ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)